# ජාතික ජනමාධ්‍ය සමුළුව - 2010

## පළමු සැසිය

## පළමු සැසිය

2010 ජනමාධ්‍ය සමුළුවේ පළමු සැසියෙහි තේමාව වූයේ **''ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අධ්‍යාපනය - ආපසු හැරී බැලීමක්''** යන්නයි. සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා මුලසුන හෙබ වූ අතර මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ මහතා විසින් සැසිය මෙහෙයවීම සිදු කරන ලදී.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් තිදෙනෙකු විසින් ශ්‍රී ලංකාවේ ජනසන්නිවේදන අධ්‍යාපනයේ ආරම්භය හා විකාශය, ශ්‍රී ලංකාවේ ජනසන්නිවේදන අධ්‍යාපනයේ වර්තමාන අභියෝග (තත්ත්ව ඇගයීම් වාර්තා ඇසුරින්) සහ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - පාසල් විෂය මාලාව හා අභියෝග යනා දී මාතෘකා පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

මේ අනුව මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ මහතා විසින් ශ්‍රී ලංකාවේ ජනසන්නිවේදන අධ්‍යාපනයේ ආරම්භය හා විකාශය යන තේමාවට අදාලව කරුණු ඉදිරිපත් කරන ලදී. මෙරට ජනමාධ්‍ය අධ්‍යාපනයේ පුරෝගාමී මෙහෙවරක් අරඹමින් 1973 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයීය සමාජීය විද්‍යා පීඨයෙහි ජනසන්නිවේදන අධ්‍යයනාංශය බිහි විය. එහිදී මෙම විෂය, විවිධ විෂයන් ඇසුරින් විෂයික පදනමක් ගොඩනගා ගත් අයුරුත්, මානවයාගේ උත්පත්තියේ සිටම එක් එක් අවධීන් හි දී මෙම විෂයේ ස්වරූපයේ වූ වෙනස්කම් යනාදියත් පිළිබඳ සාකච්ඡාවට බඳුන් විය. වර්තමානයේ සමාජීය විද්‍යා විෂයයක් වශයෙන් හඳුන්වනු ලබන, ජනසන්නිවේදනය යන නව විෂය, විශ්වවිද්‍යාලවලට හඳුන්වාදීමට හේතු වූ ''වෘත්තියාභිමුඛ පාඨමාලා'' යන සංකල්පය පිළිබඳව ද මෙහිදී කරුණු ඉදිරිපත් විය.

අනතුරුව, එක් එක් විශ්වවිද්‍යාලයන් හි මෙම විෂය අධ්‍යයනය ආරම්භ කරන ලද්දේ කුමන වසරකදී ද? එහි වර්තමාන ස්වරූපය කෙබඳු ද? කුමනාකාරයේ පාඨමාලාවන් පැවැත්වේද? යනාදී මූලික කරුණු කෙරෙහි අවධානය යොමු විය. සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියෙහිම පුළුල් ව ව්‍යාප්ත වූ මෙම විෂය පසුව පාසල් විෂය මාලාවන්ට එක් වීම පිළිබඳව සාකච්ඡා විය.

මෙවැනි විෂය ක්ෂේත්‍රයක අධ්‍යාපනයේ ගමන් මග කෙසේ විය යුතුද? මේ පිළිබඳව පොදු කතිකාවක් ගොඩ නංවනුයේ කෙසේද? මාධ්‍ය අධ්‍යයනයේ අභිප්‍රාය මාධ්‍යකරුවන් බිහි කිරීම පමණක්ද? මාධ්‍ය සාක්ෂරතාවෙන් යුතු ග්‍රාහකයන් බිහි කිරීමේ වැදගත්කම කෙබඳුද? අධ්‍යයන කාර්යයේ සාර්ථකත්වයෙහිලා අන්තර් විශ්වවිද්‍යාල මට්ටමින් හුවමාරු වැඩසටහන් ක්‍රියාවට නැංවිය යුතු බව සහ වර්තමානයේ මෙම විෂය හැදෑරීමේ වැදගත්කම යනාදී කරුණු බොහොමයක් පිළිබඳ අවධානය යොමු විය.

මෙම සැසිවාරයේ මීළඟ ඉදිරිපත් කිරීම ''ජනමාධ්‍ය අධ්‍යාපනයේ වර්තමාන අභියෝග යන තේමාවට අනුව පැවැත්විණි. ජනසන්නිවේදන තත්ත්ව ඇගයීම් වාර්තා ඇසුරින් මේ පිළිබඳ අදහස් දක්වූයේ ආචාර්ය අජන්තා හපුආරච්චි මහත්මිය විසිනි. ඒ කැලණිය, කොළඹ හා ශ්‍රී පාලි මණ්ඩපය යන විශ්වවිද්‍යාල ඇසුරිනි.

මෙහිදී ඒ ඒ විශ්වවිද්‍යාලයන් හි පාඨමාලාවල අන්තර්ගතය, දේශකවරුන්, අධ්‍යයන කාර්යයේ අභිමතාර්ථ, අධ්‍යයනයේ ගුණාත්මකභාවය යනාදී කරුණු පදනම් කරගනිමින්, තත්ත්ව ඇගයීම සැකසිණි.

සන්නිවේදන අධ්‍යයන යන විෂය වෘත්තියාභිමුඛ සංකල්පයෙහි ලා සැලකීම හේතුවෙන් ජනමාධ්‍යවේදීන් බිහි කිරීම ප්‍රධාන අරමුණ වී ඇති බවත්, ඒ හේතුවෙන් ඇති වී තිබෙන විශාල ජනප්‍රියතාව හේතු කොට ගෙන විවිධ ජනමාධ්‍ය අධ්‍යයන ආයතන බිහි ව ඇති බවත්, ඒ හේතුවෙන් මෙහි ගුණාත්මකභාවය හැල්ලුවට ලක් වී ඇති බවත් හඳුනාගත හැකි විය. තත්ත්ව ඇගයීම් වාර්තාවන්ට අනුව බලන කල, කැලණිය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්යයේ ගුණාත්මකභාවය සතුටුදායී මට්ටමක වන බවත්, කොළඹ විශ්වවිද්‍යාලයේ විෂයමාලා වෙනස් විය යුතු බවත් තහවුරු විය. එම වෙනස්වීම් මේ වන විටත් කොළඹ විශ්වවිද්‍යාලයීය ජනමාධ්‍ය අධ්‍යයන විෂයමාලාවන් හි සිදුවෙමින් පවතී.

ආචාර්ය මණ්ඩලය පිළිබඳ විමසා බැලීමේ දී මතු කළ තත්ත්වයක් වූයේ, ශිෂ්‍ය පිරිසෙන් ඉහළ ප්‍රතිශතයක් සිසුවියන් වුවත්, අධ්‍යයනාංශයන්හි ආචාර්ය මණ්ඩලයෙහි කාන්තා දායකත්වය ප්‍රමාණවත් නොවන බවයි.

එසේම මෙම විෂය හැඳින්වීම සඳහා තවදුරටත් ''ජනසන්නිවේදනය'' යන පදය භාවිත කළ යුතුද? අධ්‍යයනාංශය සඳහා ''සන්නිවේදන අධ්‍යයනය හා පර්යේෂණ මධ්‍යස්ථානය'' වැනි යෙදුමක් භාවිත කිරීම සුදුසුය වැනි අදහස් ඉදිරිපත් විය.

යුරෝපා විශ්වවිද්‍යාල හා අධ්‍යයන ආයතන, බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සමාගම (බී.බී.සී) ආදී ජනමාධ්‍යායතන සමග ප්‍රායෝගික පුහුණුව සඳහා ක්‍රමවත් ක්‍රියාපටිපාටියක් සකසා ඇති බවත් මෙරට විශ්වවිද්‍යාලයන් හි ද ප්‍රායෝගික පුහුණුව සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් නිර්මාණය විය යුතු බවත් අනාවරණය විය.

මෙම විෂයෙහි න්‍යායාත්මක පක්ෂය ''සන්නිවේදන අධ්‍යයනය'' යන්නෙන් ද ප්‍රායෝගික ස්වරූපය ''ජනමාධ්‍යවේදය'' යන්නෙන්ද හැඳින්වේ. වර්තමානයේ විෂයේ න්‍යායාත්මක ස්වරූපය අභිබවා එහි ප්‍රායෝගික ස්වරූපය වන ජනමාධ්‍යවේදය යන්න ඉස්මතු වීම ගැටළුකාරී තත්ත්වයක් බව ද අවධාරණය විය.

පළමු සැසිවාරයෙහි අවසාන ඉදිරිපත් කිරීම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සේනානි හරිශ්චන්ද්‍ර මහතාගෙනි. එහි තේමාව වූයේ, ''සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - පාසල් විෂයමාලාව හා අභියෝග'' යන්නයි. මෙහිදී මූලික වශයෙන්ම අවධානය යොමු කරන ලද්දේ යුනෙස්කෝව මගින් 1982 වසරේ දී ඉදිරිපත් කරන ලද

''ගෘන්වර්ල්ඩ් ප්‍රකාශනය'' ට (Grunewald Declaration) අනුව සන්නිවේදන අධ්‍යයනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳවයි.

ඒ අනුව සන්නිවේදන අධ්‍යයනයේ මුඛ්‍යාර්ථය විය යුත්තේ, හුදු මාධ්‍යකරුවෙකු බිහි කිරීම නොව මාධ්‍ය සාක්ෂරතා ඥානයෙන් යුතු ග්‍රාහකයෙකු බිහි කිරීමයි. පාසල් විෂයමාලාව තුළ මේ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු බවද දක්වීය.

අනතුරුව පාසල් විෂයමාලාවේ අන්තර්ගතය විශ්ලේෂණය කරන ලදී. මෙහි දී අභියෝග කිහිපයක් හඳුනාගත හැකි විය. එනම් පාසල් විෂය මාලාව අවශ්‍ය ප්‍රමාණයටත් වඩා පුළුල් ආකාරයකින් සම්පාදනය වීම ගැටළුවක් බවත්, පාසලේ වෙන් කර ඇති සීමිත කාලච්ඡේද ප්‍රමාණයක් තුළ මෙම පුළුල් විෂයමාලාව ආවරණය කළ හැකිද? යන්න සහ එම සීමිත කාල සීමාව තුළ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය සාර්ථකව කළ හැකිද? යන්නත්, පාසල් අධ්‍යාපනයේදී මෙතරම් ගැඹුරු හා සංකීර්ණ විෂය කරුණු ඉගැන්වීම නොව විෂය ක්‍රමානුකූලව හඳුන්වාදීම පමණක් ප්‍රමාණවත් බවත් අවධාරණය විය.

එසේම හඳුනාගත හැකි තවත් අභියෝගයක් වන්නේ ''ගුරු මාර්ගෝපදේශන සංග්‍රහයක්'' ප්‍රකාශයට පත් වී නොතිබීමයි. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා මේ තත්ත්වය බලපා ඇති අතර 13 ශ්‍රේණිය සඳහාද මේ වනතෙක් ගුරු මාර්ගෝපදේශන සංග්‍රහයක් සකස් වී නැත. අධ්‍යයන කාර්යය සඳහා භාවිත වන්නේ අමතර කියවීම් පොතක් වශයෙන් ප්‍රකාශයට පත්ව ඇති පෙළ පොත් පමණි. නිසි මාර්ගෝපදේශන සංග්‍රහයක් නොමැති වීමෙන් ගුරුවරුන් තුළ ඉගැන්විය යුතු සීමාව හා වපසරිය පිළිබඳ නිශ්චිත අවබෝධයක් හෝ පොදු එකඟතාවක් නොමැති වීම ගැටළු සහගතය. එය මේ වනවිටත් නිර්මාණය වෙමින් පවතී.

උසස් පෙළට නියමිත විෂය මාලාව සඳහා අමතර කියවීම් වශයෙන් සිසුන්ට පරිශීලනය කළ හැකි ආකාරයේ සිංහල මාධ්‍ය පොත්පත් ප්‍රමාණවත් නොවන හෙයින් එවැනි පොත්පත් සම්පාදනය වියයුතු බව අවධාරණය විය.

එසේම ජනසන්නිවේදනය හෝ ජනමාධ්‍ය උපාධිධාරී ගුරුවරුන් ප්‍රමාණවත් තරම් මෙම විෂය ඉගැන්වීම සඳහා යොදවා නොමැති වීම හේතුවෙන් ගුරු හිඟයක්ද පැවතීම තවත් ගැටළු සහගත තත්ත්වයකි.

පාසල් විෂය මාලාව හා සන්නිවේදන අධ්‍යයන කාර්යයේ දී මතුවන ප්‍රධාන ගැටළු අතරින් අවසාන වශයෙන් හඳුනාගත හැකි තත්ත්වයක් වන්නේ, ක්‍රමවත් ගුරු පුහුණු ක්‍රමවේදයක් නොමැති වීමයි. එසේම වෙනත් විෂයන් සඳහා පුහුණු වූ සහ වෙනත් විෂයන් උගත් ගුරුවරුන් මේ සඳහා යෙදවීම සුලබ තත්ත්වයකි. නමුත් සන්නිවේදන අධ්‍යයන කාර්යය සාර්ථක වීමෙහිලා වැදගත් වන්නේ, මේ සඳහාම පුහුණුව ලත් ගුරුවරුන් යෙදවීමයි.

එකී අභියෝග ජයගැනීමෙහි ලා ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ක්‍රමවත් සැලසුම් හා ක්‍රියාපටිපාටියක් දියත් කිරීම අත්‍යවශ්‍ය වන බව මෙහිලා අවසානයේ අවධාරණය විය.

මෙම සැසිවාරයේ දී ඉදිරිපත් වූ කරුණු පිළිබඳ සාකච්ඡාව තුළින් මතු වූ වැදගත් අදහස් බොහොමයක් විය. ඒ අනුව මෙම පාසල් විෂය මාලාවේ සංකීර්ණ බව හේතුවෙන් විවිධ විෂයික ගැටළු පැන නැගී ඇති බවත් එමගින් සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ වැරදි අර්ථකථනයක් සමාජගත විය හැකි බව මතය විය. එසේම පාසල් විෂය මාලාව තුළ මාධ්‍ය කර්මාන්තයට අදාල ප්‍රායෝගික කුසලතාවලට ඉඩකඩ සකසා ඇති ආකාරයටම ඉන් පරිබාහිර සන්නිවේදන කුසලතා වර්ධනයට ද ඉඩ ප්‍රස්තාව හිමි විය යුතුය. එසේම වර්තමානයේ පවා බහුතරයක් තුළින් දක්නට ඇති ගැටළුකාරී තත්ත්වය වන්නේ සන්නිවේදනය හදාරා ඇති නමුදු නිසියාකාරව සන්නිවේදනය කිරීමට නොදන්නා බවකි. මේ තත්ත්වය අවම කිරීමට සුදුසු වන අයුරින් පාසල් විෂයමාලා සේම විශ්වවිද්‍යාල විෂයමාලාවන්ද සංශෝධනය කිරීම වැදගත් වෙයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළදී අවශ්‍ය නම් මාධ්‍යකරුවෙකු බිහිකිරීමේ ඉඩකඩ පවතී. නමුත් පාසල් අධ්‍යාපනය තුළින් බිහිවිය යුත්තේ මාධ්‍යකරුවෙකු නොව විචාරශීලී හා මනා මාධ්‍ය සාක්ෂරතාවෙන් යුතු ග්‍රාහකයෙකි. කවර දුර්වලතා පැවතියද ජනසන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍රයක් පාසල් විෂය මාලාවට එක් කළ හැකි වීම ජයග්‍රහණයක් ලෙස හඳුනාගත හැකිවේ.

එසේම සන්නිවේදනය, වෙනත් විෂයන්හි මූලික සංකල්ප හා සුසංයෝග වීමෙන් නව උපවිෂය ක්ෂේත්‍රයන් බිහිවීම බහුල තත්ත්වයකි. මෙම නව උප විෂය ක්ෂේත්‍රයන් විෂය මාලාවන්ට (විශ්වවිද්‍යාල) එක් වීම වැදගත් තත්ත්වයකි.

එසේම සන්නිවේදන අධ්‍යයනයේ විශාල ගැටළුවක් වශයෙන් එහි ව්‍යුහාත්මක/න්‍යායාත්මක තත්ත්වය පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොවීම යන්න හඳුනාගත හැකිය. මාධ්‍ය අධ්‍යයනය තුළ ව්‍යුහාත්මක ගැටළු රැසකි. විශ්වවිද්‍යාල තුළ මාධ්‍ය/සන්නිවේදන අධ්‍යයනය ඇරඹීමෙන් දශක තුනක් පමණ දීර්ඝ කාලයක් ගත වීමෙන් පසුවයි මෙවැනි ව්‍යුහාත්මක ඇගයීම් සිදු වන්නේ. මාධ්‍ය හා සන්නිවේදනයට අදාල ප්‍රායෝගිකත්වය සීඝ්‍ර වර්ධනයකට පත්ව ඇති නමුත් එහි සංකල්පීය පාර්ශ්වය කෙරෙහි නිසි අවධානයක් යොමුව නැත. එසේම විෂය පිළිබඳ පොදු ජාතික දැක්මක් නොවේ. එහෙයින් සංකල්පීය, ව්‍යුහාත්මක හා විෂයාත්මක වශයෙන් මෙම විෂයෙහි සංවර්ධනයක් සිදු වීම අත්‍යවශ්‍යය.

එපමණක් නොව, මෙම විෂය සඳහා සමාජයේ පවත්නා අර්ථ ක්‍රමය තුළ ඉල්ලුමක් වේද? යන්න හඳුනාගැනීම වැදගත්ය. අධ්‍යාපනය හා සමගාමීව පළපුරුද්ද හා ප්‍රායෝගිකත්වය ද පැවතීම වඩාත් වැදගත්ය. සමාජය තුළ මෙම විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ වෘත්තීන් හට මනා වෘත්තීයමයභාවයක් හිමිවීම හා ඉල්ලුමක් නිර්මාණය වීම අත්‍යවශ්‍යය යනාදී වශයෙන් පළමු සැසියේ දී ඉදිරිපත් වූ කරුණුවලට පක්ෂව හා ප්‍රතිපක්ෂව විශාල අදහස් ප්‍රමාණයක් යොමු වීම විශේෂත්වයකි.

# ජාතික ජනමාධ්‍ය සමුළුව - 2010

## දෙවන සැසිය

## දෙවන සැසිය

**''විෂය ක්ෂේත්‍රය හඳුන්වා දීම, අත්දැකීම් හා ගැටළු''** යන්න තේමා කරගත් දෙවන සැසිවාරයෙහි මූලාසනය දරන ලද්දේ ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා විසිනි. මෙහිදී එක් විශ්වවිද්‍යාලයකින් එක් ආචාර්යවරයකු බැගින් ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. ඒ ඒ විශ්වවිද්‍යාලයන්හි ජනමාධ්‍ය අධ්‍යයනය ආරම්භ කරන ලද්දේ කවර වසරකදීද? විෂයමාලාවන්හි ස්වභාවය හා අන්තර්ගතය, පාඨමාලාවන්හි පවත්නා සුවිශේෂීතාව යනාදිය මෙහිලා අන්තර්ගත විය.

පළමු ඉදිරිපත් කිරීම සබරගමුව විශ්වවිද්‍යාලයෙහි භාෂා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය සුනිල් සෙනෙවි මහතා විසින් සිදු කරන ලදී. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය සම්බන්ධයෙන් ඇතැම් ගැටළු සහගත තත්ත්වයන් වන බව පෙන්වා දුන් අතර එහිදී මතු කළ වැදගත් කරුණක් වූයේ ප්‍රතිපත්තිමය රාමුවක් සැකසීමේ අවශ්‍යතාවයි. එසේම මෙහි වර්තමාන තත්ත්වය තුළ සැබෑ ගැටළුකාරී ස්වරූපයක් ඇත්තේ විශ්වවිද්‍යාලය තුළ නොව බාහිර සමාජයේ බවත් ඒ හේතුවෙන් මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයන් බොහෝ දෙනෙකුගේ ජීවිත හානි සිදුව ඇති බවත් සඳහන් විය. එසේම මාධ්‍ය, සන්නිවේදනය, ජනසන්නිවේදනය හා ජනමාධ්‍යවේදය යන යෙදුම් සඳහා නිශ්චිත අර්ථකථන නිර්මාණය කළ යුතුය යන්න හඳුනාගත හැකි විය. එසේම පාසල් පද්ධතිය තුළ මෙන්ම විශ්වවිද්‍යාල තුළ මෙම විෂය ක්ෂේත්‍රය සඳහා විවිධ යෙදුම් භාවිත වන අතර පශ්චාත් උපාධි මට්ටමේද විවිධ නාමකරණයන් යුක්ත වන බැවින් මේ සම්බන්ධ පොදු එකඟතාවකට පැමිණීම අපහසුය. එපමණක් නොව පාසල, ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධි යන සියලු අදියරයන් අතර මනා සම්බන්ධතාවක්, අඛණ්ඩ ස්වරූපයක් පැවතීම වැදගත්ය. මීට අමතරව මෙම විෂය ඉගැන්වීමේ දී ද මූලාශ්‍ර පිළිබඳ ගැටළු, සාවද්‍ය අර්ථ නිරූපණ ඉදිරිපත් කිරීම යනාදී ගැටළු සහගත තත්ත්වයන් ද අවම කරගත යුතු බව දැක්වීය.

දෙවන ඉදිරිපත් කිරීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි ලලිත කලා අධ්‍යයන අංශයෙහි අංශාධිපති අතුල සමරකෝන් මහතා විසින් සිදු කරන ලදී. මෙහිදී මෙවන් සමුළුවක් පැවැත්වීමේ හා ආචාර්යවරුන්ගේ සංගමයක් බිහි කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රථමයෙන් අදහස් පළ විය. ජනසන්නිවේදන විෂයමාලාව හා පාඨමාලාවන්හි ස්වරූපය යනාදිය විග්‍රහ කිරීමේ දී, ඉගැන්වීමේ ගැටළු බොහොමයක් වන බව දැක්වූ අතර පාසලේ දී මෙම විෂය ඉගැන්වීමේ නිවැරදි ස්වරූපය කෙබඳු විය යුතුද? පාසල් විෂයමාලා අතර මනා අන්තර් සම්බන්ධතාවයක් නිර්මාණය කළ යුතු බව, විෂයෙහි න්‍යායාත්මකභාවය තුළ හා ප්‍රායෝගිකත්වය අතර මනා සම්බන්ධතාවක් නොමැති බව, පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පොදු ක්‍රමවේදයක් සැකසීමේ වැදගත්කම මෙන්ම ආචාර්ය මණ්ඩලය නිසි අයුරින් පුහුණු කළ යුත්තේ කෙසේද? ඒ හා සම්බන්ධ ගැටළු පිළිබඳ අවධානය යොමු විය. මෙම ක්ෂේත්‍රයට යොමු වූ උපාධිධරයන් හට නිසි වෘත්තීයභාවයක් හිමි වීමේ පසුබිමක් පවතීද? යන්නත් එසේ නොවන හෙයින් ඒ සඳහා යම් කිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බවත් අදහස විය. එසේ ම වර්තමාන මාධ්‍ය කර්මාන්තය තුළ සන්නිවේදන න්‍යාය සහ එය හැදෑරූ උපාධිධරයා

පිළිබඳ විශ්වසනීයත්වයක් ගොඩනැගී නොමැති බව ගැටළුවක් බවත් හඳුනාගත හැකි විය. එසේම විෂයේ න්‍යායාත්මක පාර්ශ්වය හා මාධ්‍ය කර්මාන්තය අතර පවත්නා හිඩැස පියවීම සඳහා පියවර ගත යුතු බවද අදහස් විය.

මෙකී ගැටළුකාරී තත්ත්වයන් සඳහා විසඳුම් වශයෙන් විෂයමාලා නැවත සැකසීමත්, මෙම ක්ෂේත්‍රයට එක් වන්නන් හට නිසි වෘත්තීයභාවයක් නිර්මාණය කිරීමත්, මාධ්‍ය කර්මාන්තය තුළ විශ්වසනීයත්වය තහවුරු කිරීමත්, අවශ්‍යයෙන්ම විය යුතු බව සඳහන් විය. පෞද්ගලික හා දේශපාලනික මතවාද බැහැර කොට මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයකින් යුතු පිරිසකගේ ඒකරාශීත්වය තුළින් මෙම ගැටළු අභිබවා යාමෙහිලා ක්‍රමවත් ප්‍රතිපත්තියක් සකසා ගත යුතු බව අවධාරණය විය.

තෙවන ඉදිරිපත් කිරීම වශයෙන් යාපනය විශ්වවිද්‍යාලයෙහි කථිකාචාර්ය ක්‍රිතිකා තරුමරාජා විසින් අදහස් දැක්වීය. එහිදී එම විශ්වවිද්‍යාලය තුළ මෙම විෂය අධ්‍යයනය කෙරෙන ආකාරය හා පාඨමාලාවන්හි ස්වරූපය පිළිබඳ තොරතුරු ඉදිරිපත් විය. 2009 වසරේදී විශේෂ උපාධි පාඨමාලාවක් වශයෙන් ආරම්භ වූ මෙය මාධ්‍ය අධ්‍යයනය වශයෙන් හැඳින්වේ. මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය හා නව මාධ්‍ය යන අංශත්‍රයට විශේෂිත අයුරින් පාඨමාලාව සැකසී ඇත. විශේෂ උපාධිය සඳහා විද්‍යාර්ථීන්ගේ මෙන්ම ආචාර්යවරුන්ගේ ද වැඩි රුචිකත්වයක් වන බව හඳුනාගත හැක. පූර්ණකාලීන හා අර්ධකාලීන වශයෙන් පැවැත්වෙන ඩිප්ලෝමා පාඨමාලාවන්ද වන අතර එහිදී න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දෙ අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. අධ්‍යයනයට අවශ්‍ය සම්පත් හිඟයක් පවතින අතර ඇතැම් අත්‍යවශ්‍ය විෂය කරුණු ද න්‍යායාත්මකව පමණක් ඉදිරිපත් කිරීමට සිදු වීම ගැටළු සහගත තත්ත්වයකි. අධ්‍යයනය සඳහා අවශ්‍ය මූලාශ්‍ර/පොත්පත් පිළිබඳ ගැටළුවක් පවතින අතර විෂය කරුණු ඉගැන්වීමේ දී නිශ්චිත වචන යෙදීම ගැටළුකාරී වන අවස්ථා බොහොමයක් වන අතර එවැනි අවස්ථාවලදී ඉංග්‍රීසි පාරිභාෂිත යෙදුම ම භාවිත කිරීමට සිදු වී ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයෙහි ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අරුණ ලොකුලියන මහතා විසින් සිව් වන ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. ප්‍රථමයෙන් මෙම විෂයට අදාලව පැවැත්වෙන පාඨමාලාවන් පිළිබඳව සහ එක් එක් අධ්‍යයන වර්ෂවලට අනුව එම පාඨමාලාවන් හි අධ්‍යයනය කෙරෙන උප විෂය ක්ෂේත්‍ර හා පාඨමාලාවන්හි අන්තර්ගතය පිළිබඳ විග්‍රහ විය. පවත්නා පාඨමාලාවන්ට අමතරව විශාල වරණීය විෂය ඒකක ප්‍රමාණයකින් හා නව උප විෂය ක්ෂේත්‍ර ගණනාවකින් සමන්විත යෝජිත සාමාන්‍ය හා විශේෂ උපාධි පාඨමාලාවන්හි අන්තර්ගතය පිළිබඳව ද කරුණු ඉදිරිපත් විය. එසේම ප්‍රායෝගිකත්වයට පුළුල් ඉඩක් හිමි වන බවත්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් බොහොමයක් අන්තර්ගත වන බවත්, සාමාන්‍ය හා විශේෂ උපාධි පාඨමාලා සඳහා සිනමාව පිළිබඳ පාඨමාලාවක්ද, මහජන හා මාධ්‍ය සම්බන්ධතා සඳහා ඩිප්ලෝමා පාඨමාලාවක්ද අධ්‍යයනයට යෝජිතය. මේ ආකාරයට පාඨමාලාවන්හි හා විෂය මාලාවන්හි අන්තර්ගතය සුවිශේෂී වෙනසකට බඳුන් කිරීම හා නව ප්‍රවණතාවන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම තුළ අධ්‍යයන තත්ත්වයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අපේක්ෂිතය.

ඉන් අනතුරුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ කථිකාචාර්ය ඉමේෂා ධර්මසේන විසින් පාඨමාලාවන්හි ස්වභාවය, විෂය මාලාවන් හා අධ්‍යයන කාර්ය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී. 2001 වසරේ සිට උපාධි පාඨමාලා ආරම්භ කළ බවත් මේ සඳහා සිසුන්ගේ විශාල ඉල්ලුමක් පවතින බවත් හඳුනාගත හැකි විය. විෂයමාලා සඳහා නව විෂය ඒකක හඳුන්වා දී ඇති බවත් (ව්‍යාපාරික සන්නිවේදනය, ආපදා සන්නිවේදනය) දක්වීය. එසේම නුදුරු දිනකදීම ස්වාධීන අධ්‍යයන අංශයක් වශයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවත්නා බවද අනාවරණය විය.

සය වන ඉදිරිපත් කිරීම වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයෙහි ජනමාධ්‍යවේද ඒකකයේ කථිකාචාර්ය ෆාතිමා ෂානාස් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. මෙය ස්වාධීන ඒකකයක් වශයෙන් දැනට පවතින අතර නුදුරේදී ම ස්වාධීන අධ්‍යයන අංශයක් බවට පත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මකය. එහි පාඨමාලාව ''සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය'' වශයෙන් හැඳින්වීමට නියමිතය. 1991 වසරේ සිට ආරම්භ වූ මෙහි භාෂාත්‍රයෙන්ම ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වේ. 2011 වසරේ සිට ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් දියත් වෙමින් පවතී. සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය ද්වයෙන්ම විෂය ඒකක ඉගැන්වීම් හා විභාග කටයුතු ක්‍රියාත්මක වේ. විෂයමාලා සංශෝධනයේ දී සමුළුවේ සාකච්ඡාවට බඳුන් වූ කරුණු පිළිබඳවද අවධානය යොමු කොට වඩාත් ගුණාත්මකභාවයෙන් යුතු අධ්‍යයන ක්‍රමවේදයක් සැකසීම අපේක්ෂිතය. එසේම විදේශීය රටවලින් පැමිණෙන විද්‍යාර්ථීන් අරමුණු කරගනිමින් නව පාඨමාලා ඒකකයක්ද ඉදිරිපත් කිරීමට නියමිතය.

අනතුරුව විවෘත විශ්වවිද්‍යාලයෙහි සමාජ අධ්‍යයන අංශයෙහි කථිකාචාර්ය මධුභාෂිණී ගලගෙදර විසින් පාඨමාලාව පිළිබඳ කරුණු දක්වන ලදී. විවෘත විශ්වවිද්‍යාලයෙහි උපාධි පාඨමාලාවක් ලෙස නොව කලා උපාධි පාඨමාලාවෙහි එක් විෂය ක්ෂේත්‍රයක් වශයෙන් 1991 වසරේ දී ජනසන්නිවේදන විෂය අධ්‍යයනය ඇරඹිණි. පසුව ජනසන්නිවේදන සහතික පත්‍ර පාඨමාලාවක් ද ආරම්භ වූ අතර අධ්‍යයන කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. විවෘත විශ්වවිද්‍යාලය තුළ දුරස්ථ හා විවෘත අධ්‍යයන කාර්යයක් සිදුවන හෙයින් ඒ සඳහා අවශ්‍ය පොත් පත්, ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපනික මෙවලම් සැපයීම ද සිදු වේ. මෙය අධ්‍යයන කාර්යයේ ගුණාත්මකභාවයට හේතු වේ.

නැගෙනහිර විශ්වවිද්‍යාලයීය ත්‍රිකුණාමල මණ්ඩපයෙහි භාෂා හා සන්නිවේදන අධ්‍යයන අංශයෙහි ආචාර්ය සී.පී. රාජේන්ද්‍රන් පියතුමා විසින් ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. එය සන්නිවේදන අධ්‍යයනය නම් වන අතර ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යයනය කෙරේ. සාමාන්‍ය - බාහිර උපාධියක් සහ වසර හතරක විශේෂ උපාධි පාඨමාලා පැවැත්වේ. සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අදාල වන විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සිදු කෙරේ. විශේෂ උපාධි පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සඳහා මාධ්‍යායතන තුළ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව හිමි වේ. අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය සම්පත් හිඟයක් පවතින අතර ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සම්පත් ද සීමිතය.

හොරණ ශ්‍රී පාලි මණ්ඩපයෙහි ජනමාධ්‍ය අධ්‍යයන අංශය වෙනුවෙන් ඉදිරිපත් කිරීම සිදු කළේ ආචාර්ය රංජන් හෙට්ටිආරච්චි මහතා විසිනි. ශ්‍රී පාලි මණ්ඩපය ජනමාධ්‍ය හා ප්‍රාසාංගික කලා පිළිබඳ අධ්‍යයනයට වෙන් වූ මණ්ඩපයක් වන අතර මාධ්‍ය අධ්‍යයනයෙහි ලා මූලික ස්ථානයක් හිමි වේ. දෙදහස (2000) වසරේදී උපාධි පාඨමාලා ආරම්භ වූ අතර ජනමාධ්‍ය අධ්‍යයන පාඨමාලාව ප්‍රධාන ධාරා 04ක් යටතේ ක්‍රියාවට නැංවේ. සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් ක්‍රියාත්මක වන අතර එය ප්‍රථම වසරේ සිටම විශේෂ උපාධි පාඨමාලාවක් වශයෙන් ක්‍රියාත්මක වන්නකි. මාධ්‍ය සම්බන්ධ මනෝවිද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක, මානව විද්‍යාත්මක මෙන්ම සංඥා විද්‍යාත්මක දෘෂ්ඨි කෝණයක් සහිත ආකාරයෙන් පාඨමාලා සැකසී ඇත. එවැනි විවිධ දෘෂ්ඨි කෝණයන් රැසකින් යුතු විෂය ඒකක ගණනකින් පාඨමාලාව සැකසී ඇත. න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික කුසලතා යන දෙඅංශයම පිළිබඳව අවධානය යොමු කරමින් පාඨමාලා සැකසී ඇත. අදාල ප්‍රායෝගික කුසලතා දියුණු කර ගැනීම සඳහා මණ්ඩපය තුළම අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම පාඨමාලාවන්ට අමතරව මාධ්‍ය ගුරුවරුන් සඳහා පුහුණු පාඨමාලාවක්, ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන් ද පැවැත්වීමට යෝජිතය. අධ්‍යයන අංශය මගින් ශාස්ත්‍රීය සඟරාවක් පළ කෙරේ.

දෙවන සැසිවාරයෙහි අවසාන ඉදිරිපත් කිරීම සිදු කරන ලද්දේ, රජරට විශ්වවිද්‍යාලයෙහි මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තිස්ස වීරසේකර මහතා විසිනි. 1996 වසරේ සිට විෂය අධ්‍යයන කටයුතු ක්‍රියාවට නැංවෙන බවත් මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය යටතේ ක්‍රියාත්මක වන්නක් බවත් අනාවරණය විය. විද්‍යාර්ථීන් සඳහා මසක ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. එම ප්‍රායෝගික පුහුණුව ඇසුරින් පර්යේෂණ නිබන්ධය සැකසීම විශේෂත්වයකි.

මේ ආකාරයට එක් එක් විශ්වවිද්‍යාල විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීම් පිළිබඳ සාකච්ඡාවක් පැවති අතර එහිදී මේ සම්බන්ධ වැදගත් කරුණු රාශියක් අනාවරණය විය. මෙම ක්ෂේත්‍රයට අදාලව පර්යේෂණ කාර්යයන් සිදු විය යුතුය යන්න යෝජනා විය. විෂය මාලාවේ අන්තර්ගත විෂය ඒකක පිළිබඳව සාකච්ඡාවට බඳුන් වුවද අපේක්ෂිත අයුරින් විෂයමාලාවේ සංකල්පීය පදනම පිළිබඳ සාකච්ඡා නොවූ බව හඳුනාගත හැකි විය.

එසේම ජනමාධ්‍යායතනයක වෘත්තීය අවස්ථාව හිමි වන්නේ මාධ්‍යකරුවන් හට පමණක් නොවන බවත්, වෙනත් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තීන්ටද මෙහි බොහෝ අවස්ථාවන් වේ. නමුත් මෙම විෂයමාලා තුළ එවැනි වෙනත් විෂය ක්ෂේත්‍රයක (ඉංජිනේරු/වෛද්‍ය) රැකියාවේ නිරතවන්නන්ට ගැලපෙන ආකාරයේ සන්නිවේදන - මාධ්‍ය පාඨමාලා සැකසී නොමැති බව අවධාරණය විය. එසේ සකස් වීම වැදගත් බව යෝජනා විය.

මාධ්‍ය කර්මාන්තය තුළ හෝ ජනමාධ්‍ය ආයතනයක් තුළ පවත්නා වෘත්තීයමය සීමාව එබඳු වුවත් විශ්වවිද්‍යාල තුළ සන්නිවේදනය වැනි ගැඹුරු සහ පුළුල් විෂයයක් අධ්‍යයනයේ දී වෘත්තියාභිමුඛ වීමේ පටු අරමුණට සීමා නොවී පුළුල් දැක්මකින් හා අරමුණින් යුතු ගැඹුරු ආකල්පමය දැනීමකින් යුතු උපාධිධරයෙකු බිහි කිරීම අපේක්ෂිත බව තවත් මතයක් විය.

ජනමාධ්‍ය - සන්නිවේදනය යන්න පුළුල් හා ගැඹුරු විෂය සීමාවක් බව අවිවාදිතය. නමුත් ජාත්‍යන්තර අධ්‍යාපන රටාවට අනුව යම් විෂයක එක් උප විෂය සීමාවක් සඳහා උපාධියක් හිමි කර ගැනීම දක්වා ගැඹුරින් අධ්‍යයනය කරන අයුරු සුලබ තත්ත්වයකි. ඒ ආකාරයට ජනසන්නිවේදන විෂය පුළුල් උපවිෂය සීමාවක් දක්වා විවෘත වීම වැදගත් වේ. එසේම පාසල් විෂය මාලාව තුළ ජනමාධ්‍ය හා සන්නිවේදනය යන විෂයන් අධ්‍යයනය කිරීම ඔස්සේ සමාජගත වන සිසුන්ට පසුකාලීනව කවර ක්ෂේත්‍රයක් වුවද සාර්ථකව අධ්‍යයනය කිරීමේ පසුබිම සැකසේ.

බාහිර සමාජය තුළ ප්‍රායෝගිකව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ක්‍රියාත්මක වන්නේ එහි පිළිගත් න්‍යායික රාමුවෙන් වෙනස් අන්දමකටය. දැනට අධ්‍යයනය කෙරෙන විෂයමාලාවන් අතුරින් වඩාත් සාර්ථකම විෂය මාලාව කුමක්ද? යන්න පිළිබඳ සලකා බැලීම අනවශ්‍යය. නමුත් කවර විෂයීක දැනුමක් ලැබුවද උපාධිධරයා වත්මන් පාරිභෝගික සමාජයේ ගැටී සිය වෘත්තියෙහි නිරත විය යුතු වෙයි.

එසේම මතු වූ තවත් අදහසක් වූයේ වර්තමාන පාරිභෝගික සමාජ රටාවට වඩාත් ගැලපෙන්නේ දීර්ඝ කාලීනව අධ්‍යයනය කෙරෙන පාඨමාලා නොව කෙටි කාලීන පාඨමාලා බවයි.

මාධ්‍ය කර්මාන්තය සීඝ්‍රයෙන් වර්ධනය වන නමුත් ඊට සමගාමීව අධ්‍යයන පාර්ශ්වය වර්ධනය වී නැත. එසේ නොවී පවත්නා සමාජයට ගැලපෙන ආකාරයෙන් අධ්‍යයන කාර්යය යාවත්කාලීන විය යුතුය. එසේම හුදෙක් බටහිර ආකෘතීන් පමණක් ඉගැන්වීම අර්ථශූන්‍යය.

වෘත්තියාභිමුඛ පාඨමාලාවක් වශයෙන් සපුරා සකස් නොවුණද මාධ්‍ය කර්මාන්තයට එක් වන නව තාක්ෂණය හා නව දැනුමින් පරිපූර්ණ උපාධිධරයෙක් බිහි වීම අත්‍යවශ්‍යය. එවැනි නව දැනුමෙන් පෝෂිත උපාධිධරයන් හට මෙරට පමණක් නොව ජාත්‍යන්තර රැකියා වෙළඳපල තුළද අවස්ථා බහුලය.

විරැකියා තත්ත්වයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ සන්නිවේදන විෂය හදාරන විද්‍යාර්ථීයා තුළ සෙසු සන්නිවේදන කුසලතා මද බවයි යන්න තවත් මතයක් විය. එහෙයින් සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවත්නා මාධ්‍ය කර්මාන්තයට අදාල ක්ෂේත්‍රයන් විෂය මාලාවන්ට එක් විය යුතුය.

අධ්‍යයනයේ දී න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම සමබරව ලබා දීම වැදගත් වේ. එසේම සීඝ්‍රයෙන් දියුණු වන මාධ්‍ය කර්මාන්තයක් පවතින අවස්ථාවක, පැරණි - සාම්ප්‍රදායික විෂයමාලාවන්ට සීමා වීම අනර්ථකාරී තත්ත්වයකි. සන්නිවේදන විෂය ස්වාධීන අධ්‍යයන අංශයක් ලෙස පවත්වාගෙන යාමට තැත් දරණු වෙනුවට විවිධ විෂය ක්ෂේත්‍රයන් තුළ සිටම මෙම විෂය හැදෑරීමෙන් වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්පත් වේ. ජනමාධ්‍ය හා සන්නිවේදන අධ්‍යයනය හුදු මාධ්‍ය වෘත්තිකයෙකු බිහිකිරීමේ පටු අරමුණින් බැහැරව සංවේදී පුද්ගලයෙකු, මාධ්‍ය සාක්ෂරතාවෙන් යුතු ග්‍රාහකයෙකු බිහි කිරීම දක්වා පුළුල් විය යුතුය. ප්‍රායෝගික අත්දැකීම් ඔස්සේ නව මානයකින් යුතු අධ්‍යයන සීමාවක් නිර්මාණය කිරීම වැදගත්ය. ඒ ඔස්සේ බිහි වන

නිර්මාණශීලී හා පරිපූර්ණ පුද්ගලයා හා සම්බන්ධයෙන් වෘත්තීයභාවය පිළිබඳ ගැටළු පැන නොනගී, යනාදී විවිධ මතවාද මෙම සැසිවාරයේ ඉදිරිපත් වූ කරුණුවලට අදාලව පැන නැගුණි.

# ජාතික ජනමාධ්‍ය සමුළුව - 2010

## තෙවන සැසිය

## තෙවන සැසිය

**''ශ්‍රී ලංකාවේ සන්නිවේදන අධ්‍යාපනය හා ජනමාධ්‍ය කර්මාන්තය - අභියෝග හා ගැටළු''** යන්න තේමා කරගත් ජනමාධ්‍ය සමුළුවේ තෙවන සැසියෙහි මූලාසනය දරන ලද්දේ මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක විසිනි. මෙම සැසිවාරය මෙහෙයවීම ආචාර්ය සේන නානායක්කාර විසිනි. මෙහිදී සන්නිවේදන අධ්‍යයනය හා මාධ්‍ය කර්මාන්තය සම්බන්ධයෙන් වර්තමානයේ පවත්නා තත්ත්වයත්, මුහුණ පෑමට සිදු ව ඇති ගැටළු සහගත ස්වරූපයත් ආදිය පිළිබඳ වඩාත් ප්‍රායෝගික කතිකාවක් ගොඩනැගුණි.

මෙහිදී ප්‍රථම ඉදිරිපත් කිරීම මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස විසින් ''ජනසන්නිවේදන විද්‍යාර්ථීයා හා මාධ්‍ය කර්මාන්තය'' යන්න තේමා කරගනිමින් ඉදිරිපත් කරන ලදී. ජනසන්නිවේදනයේ න්‍යායන් හා සිද්ධාන්ත පමණක් නොව භාවිත ජනමාධ්‍ය කලාවද සන්නිවේදන විද්‍යාර්ථීන් විසින් මනාව හඳුනාගත යුතු බව එහිදී අවධාරණය විය. සන්නිවේදන අධ්‍යයනය මෙරට තුළ බිහි වූ 70 දශකයෙහි මෙහිලා අවම - සීමා සහිත පහසුකම් සහිත පරිසරයක් පැවතිය ද වර්තමානය වන විට මේ තත්ත්වයෙහි අර්ථකාරී වෙනසක් සිදු වී ඇත. එවක පැවති සීමිතව වර්ධනයට පත් ජනමාධ්‍ය කර්මාන්තය මගින් සන්නිවේදන අධ්‍යයනයෙහිලා මනා පිටුබලයක් හිමි විය. එකල සන්නිවේදන විද්‍යාර්ථීන්ට ගුවන්විදුලි සංස්ථාවෙහි මාස 06ක ප්‍රායෝගික පුහුණුවක් හිමි විය. ගුවන්විදුලි සංස්ථාවේ ලබා දුන් ප්‍රායෝගික පුහුණුවද ක්‍රමවත්ව සකසා තිබූ අතර සුගතපාල සිල්වා, පී. වැලිකල, සුදර්මන් ද සිල්වා, තේවිස් ගුරුගේ වැනි විශිෂ්ට මාධ්‍යවේදීන් යටතේ පුහුණුවීමට අවස්ථාව හිමි විය. මුද්‍රිත මාධ්‍ය පුහුණුව දයාසේන ගුණසිංහ, පෙරමුණේ තිලක හා සුමනා සපරමාදු වැනි මාධ්‍යවේදීන් යටතේ සිදු කෙරිණි. ආරම්භක වකවානුවේ මාධ්‍ය කර්මාන්තය ඔස්සේ සන්නිවේදන අධ්‍යාපනයෙහිලා මෙවන් සහයක් හිමි වුවද පසුකාලීනව මේ තත්ත්වය අනර්ථකාරී අන්දමේ වෙනසකට පත් විය. මාධ්‍ය කර්මාන්තය විස්තාරණය වූ පසුකාලීන යුගයෙහි පෙර මෙන් සාර්ථක පුහුණුවක් සන්නිවේදන විද්‍යාර්ථීන් හට ප්‍රදානය වීමක් සිදු නොවිණි. විශ්වවිද්‍යාලයන් හි අධ්‍යයනාංශ සමග පවත්වා ගෙන යන්නා වූ සම්බන්ධතා මත යම් තරමක සාර්ථක ප්‍රායෝගික පුහුණුවක් ලබා ගත හැකි වුවත් එය සපුරා විධිමත් පුහුණුවක් වශයෙන් හඳුනාගැනීම අසීරුය. ඉන් තහවුරු වන්නේ මාධ්‍ය කර්මාන්තයේ වර්ධනය හා අභිවෘද්ධිය තුළ විද්‍යාර්ථීයා පෝෂණය කිරීමේ කාර්යය අඩාල වීමක් සිදුව ඇති බවයි.

මාධ්‍ය කර්මාන්තය හා විද්‍යාර්ථීයා අතර සම්බන්ධතාව මෙබඳු වුවත් මේ සම්බන්ධයෙන් විද්‍යාර්ථීන් විසින්, මාධ්‍ය කර්මාන්තයේ පවත්නා සංකීර්ණතාවන්ට ගැලපෙන අයුරින් තම කුසලතා වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය වෙයි. එසේම කර්මාන්තය අතින් ගත් කළ මාධ්‍ය කර්මාන්තය තුළ විද්‍යාර්ථීයාට නිසි තැනක් හිමි වීමද සිදු විය යුතුයි.

වර්තමාන කර්මාන්තය පිළිබඳ යථාර්ථවත්ව විමසන විට පෙනී යන්නේ කර්මාන්තය තුළ යම් දිළිඳු බවක් - මූල්‍යමය අර්බුදයක් වන බවයි. මෙකී තත්ත්වය තුළ ප්‍රායෝගික පුහුණුවක් ලබා දුන් විද්‍යාර්ථීයා අඛණ්ඩව එකම මාධ්‍යායතනයක රඳවා ගැනීමේ අපහසුවක් පවතී.

මාධ්‍යායතන කෙරෙහි බලපාන දේශපාලන හා හිමිකාරීත්ව බලපෑම් හේතුවෙන් ද මෙම තත්ත්වයන් හි වෙනසක් විය හැකිය.

මෙම කවර තත්ත්වයක් තුළ වුවද, පුහුණු හා භාවිත අත්දැකීම් සහිත වෘත්තිකයෙකු ලෙස මෙන්ම බහු විෂයික දැනුමින් පරිපූර්ණ විද්‍යාර්ථියෙකු වශයෙන් දෙයාකාර භූමිකාවක් සාර්ථකව ඉටු කිරීමට විද්‍යාර්ථීයා සමත් විය යුතු බැව් මෙම ඉදිරිපත් කිරීම ඔස්සේ අනාවරණය විය.

අනතුරුව තෙවැනි සැසිවාරයේ ඉදිරිපත් කිරීම් තුනක් ඉදිරිපත් වූ අතර එහි තේමාව වූයේ ''ජනසන්නිවේදන උපාධිධරයා හා සමාජය'' යන්නයි. මේ සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම අදහස් දක්වන ලද්දේ හොරණ ශ්‍රී පාලි මණ්ඩපයේ කථිකාචාර්ය සුගත් මහින්ද සෙනරත් විසිනි. සන්නිවේදන අධ්‍යාපනය හුදෙක් මාධ්‍ය කර්මාන්තයෙන් වියුක්තව පැවතිය යුත්තක් නොවේ. කර්මාන්තය හා විශ්වවිද්‍යාල අතර අන්‍යොන්‍ය සහයෝගීතාවක් පැවතීම වැදගත්වේ. මන්ද විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සියලු මෙවලම් විශ්වවිද්‍යාල තුළ සම්පාදනය කළ නොහැකි බැවින් කර්මාන්තය හා සම්බන්ධ වීම අවශ්‍යය. පෞද්ගලික මාධ්‍යායතනවල, හිමිකාරීත්වය මත පදනම් වූ පෞද්ගලික න්‍යාය පත්‍ර ක්‍රියාවට නැංවෙන බැවින් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමේ දී යම් ගැටළු සහගත බවක් ඇතිවිය හැකි වුවත් රාජ්‍ය මාධ්‍යයන්හි වැඩි අවස්ථාවක් හිමි කරගත හැකිවේ. මුල් කාලීනව ''ඒෂියා ෆවුන්ඩේෂන්'' වැනි සංවිධාන මගින් ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ආයතන සඳහා යම් ගෙවීමක් කළ අතර මේ හේතුවෙන් විධිමත් පුහුණුවක් ලබා දීමට එම මාධ්‍යායතන උත්සුක විය. වර්තමානය වන විට මෙම තත්ත්වයෙහි වෙනසක් සිදු වී ඇති අතර ප්‍රායෝගික පුහුණුවෙහි ගුණාත්මකභාවයද අවප්‍රමාණ වී ඇත. මේ තත්ත්වය තුළ අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වන්නේ, බිහිවන සන්නිවේදන උපාධිධරයන් සැබවින්ම මාධ්‍ය කර්මාන්තයට ගැලපේද? යන්නයි. විද්‍යාර්ථීයා වඩාත් රුචිකත්වයක් දක්වන උපවිෂය ක්ෂේත්‍රය ඔස්සේ දිගින් දිගටම මනා පරිචයක් හිමි කර ගැන්ම ඔස්සේ වඩාත් සාර්ථකව මාධ්‍ය කර්මාන්තයට හැඩගැසීමට හැකිවේ. එසේම වේගයෙන් වර්ධනය වන මාධ්‍ය කර්මාන්තයට යෝග්‍ය වන පරිදි විශ්වවිද්‍යාලයන් හි විෂය මාලා ද යාවත්කාලීන වීම අවශ්‍යයෙන්ම සිදු විය යුත්තකි. විශ්වවිද්‍යාල අතර විෂයමාලාවන්හි පරස්පරතා පැවතීම ගැටළුවක් නොවේ. එසේම සන්නිවේදන විද්‍යාර්ථීයා හුදෙක් මාධ්‍යායතනයක සේවයේ නිරත වීම සඳහා හැඩගස්වනු වෙනුවට මහජන සම්බන්ධතා අංශය, ගුරු වෘත්තිය ආදී තවත් බොහෝ ක්ෂේත්‍රයන් හි වෘත්තීමය පරිසරයට ගැලපෙන සේ අධ්‍යයන රටාව සැකසිය යුතුය. මේ ආදී කරුණු පිළිබඳ අවධානය යොමුකොට සුදුසු සැලසුම් නිර්මාණය කිරීම මෙවැනි සමුළු ඔස්සේ සිදු විය යුතුය.

ආචාර්ය අජන්තා හපුආරච්චි විසින් ජනසන්නිවේදන උපාධිධරයා හා සමාජය යන තේමාවෙන් අදහස් දක්වන ලදී. විශ්වවිද්‍යාලයන්හි විෂයමාලා හා අධ්‍යාපන ක්‍රමවේදය යල් පිනූ, ක්‍රමවේදයක් බව මාධ්‍යවේදීන්ගේ අදහසයි. එය සාවද්‍ය මතවාදයකි. විශ්වවිද්‍යාල සතුව අධ්‍යයන කාර්යයෙහි ලා ප්‍රමාණවත් මට්ටමේ පහසුකම් හා සම්පත් නොමැති වීම විනා ඉන් සම්පාදනය කරනු ලබන්නේ යල් පිනූ දැනුමක් නොවේ. ඇතැම් ඉන්දීය මෙන්ම යුරෝපීය රටවල විද්‍යාර්ථීන් සඳහා එරට මාධ්‍යායතන මගින් ක්‍රමවත්

ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමේ ක්‍රමවේදයක් පවතී. නමුත් මෙරට පවත්නා දේශපාලනික හා හිමිකාරීත්ව බලපෑම් හේතුවෙන් මෙවැනි විධිමත් ක්‍රමවේදයක් ගොඩනැගී නැත. මාධ්‍ය කර්මාන්තය විසින් විද්‍යාර්ථීයා පිළිබඳ සෘණාත්මක ආකල්පයකින් ඇගයීම් සිදු කළද වර්තමානය වන විට විශ්වවිද්‍යාල විෂයමාලාවන් හි මාධ්‍ය කර්මාන්තයේ භාවිත වන නව ප්‍රවණතා බොහොමයක් අන්තර්ගත වී තිබේ. මෙවැනි සමුළු ඔස්සේ ආචාර්යවරුන් අතර මනා සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම තුළ මේ තත්ත්වයට සාර්ථක විසඳුම් ලද හැක.

මෙම තේමාව ම අදාල කරගනිමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ධම්මික ගංගානාත් විසින් අදහස් දක්වන ලදී. සෑම විශ්වවිද්‍යාලයකම වර්තමානයේ මුහුණ පෑමට සිදු ව ඇති පොදු ගැටළුවක් වන්නේ ප්‍රායෝගික පුහුණුව පිළිබඳ ගැටළුවයි. වර්තමානයේ බොහෝ කොට සිදුවන්නේ පවත්නා පෞද්ගලික සබඳතා මත ප්‍රායෝගික පුහුණු අවස්ථා සලසා ගැනීමයි. දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සන්නිවේදන උපාධි පාඨමාලාව බහුවිෂයික පාඨමාලාවක් වශයෙන් සැකසී ඇත. එය සන්නිවේදනයේ උපවිෂය ක්ෂේත්‍රයන්ට පමණක් සීමා නොවන අතර ජනසන්නිවේදන විශේෂ උපාධියක් සඳහා සම්පූර්ණ කළයුතු සමස්ත විෂය සම්භාර 40න් 24ක් ජනසන්නිවේදන විෂය ඒකකයන්ගෙන්ද ඉතිරිය සෙසු විෂය ඒකකයන්ගෙන්ද පූර්ණය කිරීමේ හැකියාව පවතී. නමුත් එම තෝරාගැනීම සිදු කළ හැක්කේ කලා විෂය ධාරාවේ විෂය ඒකකයන් ඇසුරින් පමණි. මෙය අලෙවිකරණය, වෛද්‍ය විද්‍යාව හෝ වැනි සෙසු විෂය පථයන් කෙරෙහි ද පුළුල් වීම අවශ්‍යයෙන්ම සිදු විය යුත්තකි. මෙවැනි ක්‍රියාවලින් ඔස්සේ සන්නිවේදන විද්‍යාර්ථීයා මාධ්‍ය කර්මාන්තයට වඩාත් ගැලපෙන දැනුමකින් හා ප්‍රායෝගික කුසලතාවෙන් පරිපූර්ණ පුද්ගලයෙකු බවට පත් කළ හැකි වේ.

මෙම ඉදිරිපත් කිරීම්වලින් අනතුරුව සැසිවාරය තුළ ඉදිරිපත් වූ කරුණු සම්බන්ධ අදහස් දැක්වීමේ අවස්ථාව හිමි විය. විද්‍යාර්ථීන්ට ප්‍රායෝගික පුහුණුවක් නොලැබීම යන්න මීට පෙර වකවානුවල පැවති ගැටළුවකි. මීට දශකයකට පමණ පෙර සිට කිසියම් ආකාරයක හෝ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සිදුවිය. වර්තමානය වන විට ප්‍රායෝගික පුහුණුව සඳහා අවශ්‍ය තාක්ෂණික මෙවලම් හි හිඟයක් පවතී. මෙකී තත්ත්වයට විසඳුමක් ලෙස විශ්වවිද්‍යාල හා ජනමාධ්‍යායතන අතර ක්‍රමවත් ප්‍රතිපත්තියක් සැකසීම අත්‍යවශ්‍ය වෙයි. මෙහිලා ජාතික ප්‍රතිපත්තියක් පැවතීම අවශ්‍යය. ප්‍රායෝගික හා න්‍යායික යන දෙඅංශයෙන්ම පිරිපුන් විද්‍යාර්ථීයෙකු බිහි කළ යුතුය.

නමුත් පරිපාලනමය හා දේශපාලනමය බලපෑම් මත විශ්වවිද්‍යාල සඳහා ප්‍රායෝගික පුහුණුවක් ක්‍රියාවට නැංවීම යන කරුණ අර්බුදයට ලක් වීම ස්වභාවික තත්ත්වයකි.
මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු සාධක වී ඇත්තේ ආකල්පමය අර්බුදයකි. විශේෂයෙන්ම පෞද්ගලික මාධ්‍යායතන තුළ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීයා පිළිබඳව පවතින්නේ සෘණාත්මක ආකල්පයකි. ඉන් කලා උපාධිධරයා වඩාත් අවතක්සේරුවට ලක් වේ. ඒ තත්ත්වය මත ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම අවම වන අතර එය ශිෂ්‍ය ප්‍රතිරූපයට සිදු කෙරෙන ප්‍රබල හානිකර තත්ත්වයකි. වගකිවයුත්තන් එක්ව විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ හා උපාධිධරයන්ගේ ප්‍රතිරූපය ඉහළ නැංවීමේ ක්‍රියාවලියක් වෙත යොමු විය යුතුය.

වර්තමානයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පවත්නා අර්ධ වාර්ෂික අධ්‍යයන ක්‍රමවේදය තුළ (Semester System) විද්‍යාර්ථීයා පරීක්ෂණ සඳහා ඉලක්ක කරනු විනා ප්‍රායෝගික කුසලතා කෙරෙහි යොමු වීමක් සිදු නොවේ. මෙය මෙවැනි අනර්ථකාරී ප්‍රතිඵල නිර්මාණය වීමෙහි ලා එක් හේතු සාධකයක් ලෙස හඳුනාගත හැක.

මාධ්‍ය කර්මාන්තය වේගයෙන් වර්ධනයට පත්වීම තුළ විද්‍යාර්ථීයා එයට ගැලපෙන අයුරින් හැඩ ගැස්වීම අනිවාර්යයෙන් සිදු විය යුත්තක්ද? නැත. මාධ්‍යයේ වර්ධනය ගුණාත්මක හෝ සාධනීය නොවන ආකාරයෙන් සිදුවීම සාමාන්‍ය තත්ත්වයකි. මාධ්‍ය කර්මාන්තයට අවශ්‍ය පරිදි විද්‍යාර්ථීයා පරිශ්‍රමයකින් හැඩගැස්විය යුතු නොවේ. මනා න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික හා සෙසු සන්නිවේදන කුසලතාවෙන් පිරිපුන් උපාධිධාරියෙකු බිහි වීම තුළ මේ තත්ත්වය ගැටළු සහගත නොවේ.

අන් විෂයන් සේම සන්නිවේදනය ද න්‍යායාත්මකව හැදෑරිය හැක. නමුත් එහි ප්‍රායෝගික පක්ෂය මනාව හඳුනා ගැනීමෙන් තොර වීමෙන් සන්නිවේදන කාර්යය සාර්ථක නොවේ. එසේම අගනුවරට ආසන්න විශ්වවිද්‍යාල සඳහා කවරාකාරයෙන් හෝ ප්‍රායෝගික පුහුණුවක් ලද හැකි වුවත් සෙසු විශ්වවිද්‍යාලවලට මෙය වඩාත් සංකීර්ණ ආකාරයෙන් බලපාන්නකි. මෙය බරපතල ගැටළුවකි. ආරම්භක වකවානුවේ දී මෙන් පරිපූර්ණ ආකාරයේ විධිමත් ප්‍රායෝගික පුහුණුවක් ලබා දිය නොහැකි වුවත් වර්තමානයේ ද යම් ආකාරයක ක්‍රමවත් ප්‍රායෝගික පුහුණුවක් හිමි වීම අවශ්‍යයෙන්ම සිදුවිය යුතුය. වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව වැනි විෂයන් හි අනිවාර්ය පුහුණුවක් හිමි වන්නා සේ සන්නිවේදනයටද අදාලව එවැනි ක්‍රමවේදයක් සකස් වීම අත්‍යවශ්‍යය.

බොහෝ අවස්ථාවල දී රැකියා වියුක්තිය පිළිබඳ ගැටළු මතුවීමට හේතු වන්නේ උපාධිධරයා විසින් සන්නිවේදනය හා ඊට අදාල ප්‍රායෝගික පුහුණුවට අමතරව වර්ධනය කරගත යුතු ඉංග්‍රීසි භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණ හෝ පරිගණක පත් කර නොගැනීමයි. එහෙයින් මෙම කරුණ පිළිබඳ අවධානය යොමු වීම වැදගත් වේ.

සන්නිවේදනය අධ්‍යයනය ඔස්සේ මාධ්‍ය කර්මාන්තයට ගැලපෙන ආකාරයේ වෘත්තිකයෙකු බිහි වීම ම අරමුණු කර නොගත මුත්, මාධ්‍ය කර්මාන්තය තුළ සන්නිවේදන උපාධිධරයාට සුදුසු වෘත්තීයමය තත්ත්වයක් නිර්මාණය වී පැවතීම අත්‍යවශ්‍යය.

වෛද්‍ය විද්‍යාව වැනි ක්ෂේත්‍රයන් හි මෙවන් නිශ්චිත සීමාවක් තුළ වෘත්තීයමයභාවයක් ගොඩ නැංවිය හැකි වුවත් මාධ්‍ය ක්ෂේත්‍රය තුළ එවැනි තත්ත්වයක් නිර්මාණය කිරීමට තැත් දැරීම මාධ්‍ය නිදහසට තර්ජනයක් යැයි ගැටළු මතු කරන්නක් විය හැක. බොලීවියාව වැනි රටවලින් මේ තත්ත්වයට උදාහරණ සැපයිය හැක. එවැනි තත්ත්වයක් නිර්මාණය කිරීමට උත්සහ දැරීම, නිදහසේ ජනමාධ්‍යවේදයට ප්‍රවේශ වීමට ඇති ඉඩකඩ අවුරාලීමක් වශයෙන් සලකා මාධ්‍ය නිදහස පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් බවට පත් විය හැක.

වර්තමානයේ ''දැනුම'' යනු ලාභය තීරණය වන මුඛ්‍ය සාධකයයි. එහෙයින් වර්ධිත මාධ්‍ය කර්මාන්තය තුළ දැනුමින් පරිපූර්ණ උපාධිධරයාට රැකියා අවස්ථාවන් පිළිබඳ ගැටළු මතු නොවේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ප්‍රායෝගික කුසලතා වර්ධනයෙහිලා අවශ්‍ය පහසුකම් සපයා ගැනීම සඳහා අන්තර් විශ්වවිද්‍යාල මට්ටමින් හුවමාරු වැඩසටහන් ක්‍රියාවට නැංවීම වඩාත් සාර්ථක ක්‍රමවේදයක් විය හැක. මාධ්‍ය ආයතනයන්හි පවත්නා අවස්ථාවන් හිමි කර ගැනීම සඳහා පොදුවේ ඒකරාශී වීමෙන් ක්‍රියා කිරීම වැදගත් වේ.

# ජාතික ජනමාධ්‍ය සමුළුව - 2010

## සිව් වන සැසිය

## සිව් වන සැසිය

ජාතික ජනමාධ්‍ය සමුළුවෙහි දෙවන දිනයෙහි දී සමුළුවේ සිව් වන සැසිවාරය පැවැත්විණි. **"ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ප්‍රතිපත්ති"** යන මැයෙන් පැවති සැසියෙහි මෙහෙයවීම ආචාර්ය ටියුඩර් වීරසිංහයන්ගෙන් වූ අතර මුලසුන දරන ලද්දේ මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස විසිනි.

මෙහි ප්‍රථම ඉදිරිපත් කිරීම "ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්ති විමසා බැලීමක්" යන තේමාවෙන් ආචාර්ය ටියුඩර් වීරසිංහ විසින් සිදු කරන ලදී. රටේ ජනමාධ්‍ය විෂයෙහි ප්‍රතිපත්තියක් බිහි කිරීමට නම් එරටෙහි ජාතික ප්‍රතිපත්තියක් පැවතිය යුතු වෙයි. එසේ නොමැතිව මාධ්‍ය ප්‍රතිපත්තියක් බිහි කිරීමට තැත් දැරීම සාර්ථක නොවේ. වර්තමානයේ මාධ්‍ය යනු මිනිස් ක්‍රියාකාරීත්වය නිර්ණය කරනු ලබන ප්‍රධාන බලවේගය බවට පත්ව ඇත. එසේම මාධ්‍ය යනු කර්මාන්තයකි. ව්‍යාපාරයකි. විශාල අධ්‍යයන ක්ෂේත්‍රයකි. රටක පොදු අරමුණු, මිනිස් සිතුම් පැතුම්, දේශපාලන සබඳතා ආදී තවත් බොහෝ ක්‍රියාකාරකම් ක්‍රමවත් ව පවත්වාගෙන යාමෙහිලා මාධ්‍ය යන්න වැදගත්ය. මේ තත්ත්වය තුළ මාධ්‍ය ප්‍රතිපත්තියක් පැවතීම අතිශය අවශ්‍යය. මාධ්‍ය අධ්‍යයනය හා මාධ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ පුද්ගලයන් රටේ බුද්ධිමය පාර්ශ්වයට අයත් වේ. එය ප්‍රධාන භූමිකාවකි. නමුත් වර්තමානය වන විට සමාජයේ පවත්නා අවශ්‍යතා මාධ්‍ය ඔස්සේ නිරූපණය වේද? යන්න ගැටළුවකි. එසේම මාධ්‍ය මගින් නිර්මාණය කරනු ලබන ජනමතය සැබෑ මහජන මතය ද? යන්නද ගැටළු සහගතය. මෙම තත්ත්වය මෙන්ම ග්‍රාමීය, නාගරික, අර්ධ නාගරික, සංස්කෘතික, වාර්ගික ආදී විවිධ සමාජ විභින්නතා පිළිබඳ සැලකිලිමත් වෙමින් මාධ්‍ය ප්‍රතිපත්ති සැකසීම සිදුවිය යුතුය.

පසුගිය දශක තුනක යුදමය සමාජ පසුබිම තුළ බහුතර මාධ්‍යායතන සංඛ්‍යාවක් ප්‍රභවය වී ඇත. එකී සමාජ පසුබිමට සුදුසු වන සේ මාධ්‍ය ප්‍රතිපත්ති, අන්තර්ගතය, සමාජ බලවේගයන්හි අවශ්‍යතා නිර්මිතය. එකී සියල්ල යුද ආඛ්‍යානයක් සහිතය. නමුත් ගැටළුව වන්නේ, වර්තමානයේ පවත්නා පශ්චාත් යුදමය සමාජ පසුබිමට එය කෙසේ ගැලපේද? යන්නයි. පශ්චාත් යුද කාල සීමාවක් වශයෙන් වර්තමානයේ පැවතිය යුත්තේ සංවර්ධන කේන්ද්‍රීය ක්‍රියාවලියකි. එහෙයින් මාධ්‍ය ප්‍රතිපත්තියද සංවර්ධන කේන්ද්‍රීය මාධ්‍ය ප්‍රතිපත්තියක් බවට පත් වීම අත්‍යවශ්‍යය. නමුත් යුදමය තත්ත්වය අවසන් වී වසර 1 1/2 ක පමණ කාලසීමාවක් ගත වී ඇතත් එවැනි මාධ්‍ය ප්‍රතිපත්තියක් කෙරෙහි මනා අවධානයක් යොමු වී නැත. එසේම පවතින ලිබරල් ආර්ථික ක්‍රමය තුළ ජාතික ජනමාධ්‍ය ක්‍රමවේදයක් ගොඩ නැගීම කෙතරම් සාර්ථක වූවක්ද යන්න විමසිය යුත්තකි. එය ක්ෂණිකව කළ හැක්කක් නොවන අතර දීර්ඝකාලීන පර්යේෂණ ක්‍රමවේදයක් ඔස්සේ ක්‍රියාවට නැංවිය යුත්තකි.

මෙහිදී හඳුනාගත යුතු වැදගත් ලක්ෂණයක් වන්නේ රටේ බුද්ධිමතුන් හා රාජ්‍යත්වය අතර පවතින්නා වූ සම්බන්ධතාවේ ස්වභාවයයි. එංගලන්තයේ වැඩවසම් යුගය තුළ රජිනගේ ආධිපත්‍යය තුළ මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් වූ අතර ප්‍රංශයේ තත්ත්වය මීන් ඔබ්බට විහිදී ගොස් ඇත. ජර්මානු බුද්ධිමතා ද වැඩවසම් රාමුවක් තුළ ක්‍රියාත්මක වේ. මෙරට එංගලන්ත වැඩවසම් ආකෘතියට සමාන බවක් හඳුනාගත හැක. මුල් වකවානුව තුළ

යම් ආකාරයක ස්වාධීනත්වයක් හඳුනාගත හැකි වුවත් පසුව දේශපාලන බලවේගයන්ට අනුව එය තීරණය වන ස්වභාවයකට පත් ව ඇත.

නිදහසින් පසු කාලසීමාවේ දී මෙරට බුද්ධිමතුන් හට දේශපාලකයන්ගේ බලපෑම්වලට නතු වීමට සිදු වූ නමුත් ප්‍රංශය වැනි රටවල බුද්ධිමතුන් විසින් දේශපාලනයට බලපෑම් කිරීමට සමත් විය. මාධ්‍යයට ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ ඇයි? යන කරුණ පිළිබඳ සලකා බැලීමේ දී මාධ්‍ය යනු සංකීර්ණ ක්‍රියාකාරීත්වයක් ඇති බහුකාර්ය ව්‍යුහයකි. එය යම්කිසි ආකාරයකින් නියාමනය කළ යුතුය යන්න අවිවාදිතය. මෙම සමාජයේ පවත්නා ඓතිහාසික, ජාතික සංදර්භයන් තුළ සමාජයට ගැලපෙන අයුරින් කවරාකාරයේ ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් ගොඩ නැංවිය යුතුද? යන්න හඳුනාගත යුතුවේ. එය සමාජයේ සංස්කෘතික, ආගමික, ඓතිහාසික යන සමස්තය නියෝජනය වන ආකාරයේ ප්‍රතිපත්ති මාලාවක් වීම අවශ්‍යය.

මෙහිදී ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යංශය විසින් ප්‍රකාශයට පත් කර ඇති ''ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය'' පිළිබඳ ව අවධානය යොමු විය. මෙය යථෝක්ත ආකාරයේ ප්‍රතිපත්ති මාලාවක් ලෙස අර්ථ ගැන්විය නොහැකි බවත් එක්තරා ආකාරයක ආචාර ධර්ම පද්ධතියක් පමණක් බවත් ප්‍රකාශ විය. කෙසේ වතුදු, සැකසෙන මාධ්‍ය ප්‍රතිපත්තිය, රටේ සමාජාර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් විය යුතුය. එසේ ගොඩ නැගෙන මාධ්‍ය ප්‍රතිපත්තිය තුළ එක් එක් මාධ්‍යායතනයට විශේෂිතව ප්‍රතිපත්ති සකසා ගත යුතු බව අවධාරණය විය.

අනතුරුව සිව්වන සැසිවාරයේ දෙවන ඉදිරිපත් කිරීම ආචාර්ය මහීම් මෙන්ඩිස් විසින් ඉදිරිපත් කෙරුණු අතර එහි තේමාව වූයේ ''ජනමාධ්‍ය නිදහස, වගකීම හා ආචාර ධර්ම'' යන්නයි. මූලිකවම අවධානය යොමු විය යුත්තේ රටේ පවත්නා සංස්කෘතික වටපිටාවට ගැලපෙන අයුරින් මාධ්‍ය සංස්කෘතියක් ගොඩ නැංවීමටයි. මාධ්‍ය කිසියම් පාලනයකට නතු විය යුතු බවද අවිවාදිතයි. දශක තුනක් පුරා අප ලිබරල්වාදී වෙළඳපල ආර්ථික ක්‍රමයක් මෙන් ම මාධ්‍ය සංස්කෘතියක් පිළිබඳ ව සාකච්ඡා කළද ඒ පිළිබඳ විවෘත මනසකින් හා පුළුල් දෘෂ්ටි කෝණයකින් ක්‍රියා කරන බවක් දකින්නට නැත. මාධ්‍ය සඳහා ප්‍රතිපත්ති සැකසිය යුත්තේ නිදහස් මාධ්‍ය සංස්කෘතියක් තුළ සිටය. මාධ්‍ය සඳහා යම් නියාමනයක් අවශ්‍ය වුවද එය සපුරා රාජ්‍ය ආධිපත්‍යයක් සහිත නියාමන ක්‍රමවේදයක් වීම යෝග්‍ය නොවේ. ජනමාධ්‍යවේදීන් ස්වයං නියාමනයක් සහිත වීම වඩා වැදගත්ය. එසේම පාලකයා හා පාලිතයා අතර පවත්නා මතවාදීමය හිඳැස (gap) ස්වාධීනව පවත්වාගෙන යාම අවශ්‍යය. පාලකයන්ගේ කිසියම් අදහසක් පාලිතයන් විසින් අනුමත නොකරයි නම් එවැනි ප්‍රතිවිරුද්ධ මත ක්‍රියාවට නැගෙන්නේ මෙකී හිඩැස තුළය. මාධ්‍යයට අදාල ප්‍රතිපත්ති, වගකීම හෝ නියාමනය සිදු විය යුත්තේ නිදහස් හා විවෘත මාධ්‍ය සංස්කෘතියක් තුළ හිඳය. මින් බැහැරව මාධ්‍යයේ නිදහස් පැවැත්මට යම් ආකාරයක බාධා පැමිණවේ නම් ඊට එරෙහිව මතවාදයන් මතු කරවන, බලපෑම් කණ්ඩායමක් වශයෙන් සන්නිවේදන ආචාර්යවරුන් ක්‍රියා කිරීම වැදගත් බව අවධාරණය විය.

අනතුරුව සැසිවාරය තුළ ඉදිරිපත් වූ අදහස් සම්බන්ධයෙන් මත දක්වීම ආරම්භ විය. මාධ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ කතිකාවේදී මතු විය යුත්තේ ප්‍රධාන කරුණු දෙකකි. ඒ ''වෙනස'' හා ''ප්‍රගතිය'' යන ප්‍රධාන සාධක දෙකයි. පවත්නා තත්ත්වය යම් ආකාරයකට වෙනස් කළ යුතු බව පොදුවේ සැවොම දන්නා සහ පිළිගන්නා කරුණකි. එහෙයින් මෙහිදී අවධානය යොමු කළ යුත්තේ එය කෙසේ වෙනස් විය යුතුද? යන්න සහ පවත්නා තත්ත්වය තුළ එය සිදු කළ යුත්තේ කවරාකාරයෙන්ද යන භාවිතමය තත්ත්වයයි.

මාධ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ කතිකාවේ දී මාධ්‍ය නිදහස යන්න ප්‍රමුඛව මතුවන කරුණකි. මෙහිදී අවධානය යොමු කළ යුතු වන්නේ, නිදහස ලබා දිය යුත්තේ කවර ප්‍රමාණයකටද? නිදහස හිමි විය යුත්තේ කවරෙකුටද? සහ එය ඇරඹිය යුත්තේ කවර ස්ථානයකින්ද? යන්නයි. මෙය ගැටළු සහගතය. සංකල්පීය වශයෙන් පවත්නා නිදහස යන මතවාදය භාවිත - ප්‍රායෝගික තලයේ දී ක්‍රියාවට නැංවිය හැකි මට්ටම කුමක්ද? යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතුය. මාධ්‍ය නිදහස පිළිබඳ කතිකාවේ දී බටහිර සමාජයන් හි පවත්නා නිදහස යන්න අභිරුචියෙන් මතු කර දැක්වුවද එවැනි රටවල පවා සැබෑ මාධ්‍ය නිදහසක් පවතීද? යන්න මනාව අවබෝධ කරගත යුත්තකි. නිදහස යන සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේ දී සැබවින්ම මතුවන්නේ කිසියම් සීමා සහිත බවකි. එසේම වර්තමාන මාධ්‍ය සමාජය තුළ නිදහස යන්න වගකීමකින් ක්‍රියාවට නැංවෙන්නේ ද යන්න ගැටළු සහගතය. එහෙයින් මෙම ප්‍රතිපත්ති කෙබඳු විය යුතු ද යන්න තීරණය කළ යුත්තේ බහුවාර්ගික පදනමක් තුළ පිහිටමිනි.

මාධ්‍ය ප්‍රතිපත්තියක් සැකසීමේ දී යාපන අර්ධද්වීපය ඇතුළු උතුරු නැගෙනහිර ජනතාවගේ අවශ්‍යතා, අදහස් කෙබඳුද? එම ප්‍රදේශයන් හි ජනමාධ්‍ය භාවිතාව කෙබඳුද? මාධ්‍ය නිදහස පවතින්නේ කවරාකාරයෙන් ද? යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුව පවතී.

මාධ්‍ය ප්‍රතිපත්ති හා ප්‍රායෝගිකව භාවිතයට පත් මාධ්‍ය ක්‍රියාකාරීත්වය අතර පවත්නා වෙනස එදා පටන් අද දක්වාම පවතින්නකි. සන්නිවේදන අධ්‍යයනයේ දී න්‍යායාත්මක ව කුමක් උගත්තද? ප්‍රායෝගිකව මාධ්‍ය කර්මාන්තය තුළ ක්‍රියාත්මක වීමේ දී එහි පරස්පරතා මතු වීම සාමාන්‍ය ස්වභාවයයි. ප්‍රායෝගික තත්ත්වය එසේ වුවත් සන්නිවේදනයේ නිවැරදි න්‍යායාත්මක දැනුම ලබාදීම සිදු කළ යුතුයි. එපරිද්දෙන්ම මාධ්‍ය කර්මාන්තය තුළ ප්‍රායෝගිකව ක්‍රියා කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා ද ලබා දීම වැදගත් වේ.

විද්‍යාර්ථීන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දීමේ දී විශ්වවිද්‍යාල හා ජනමාධ්‍යායතන අතර මනා සබඳතාවක් නොමැති බව තහවුරු වේ. එහෙයින් මේ අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව වර්ධනය කිරීම අවශ්‍යය.

මාධ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ කාර්යය සමාජ ක්‍රියාවලියකි. එය ක්ෂණිකව කළ හැක්කක් හෝ කළ යුත්තක් නොවේ. එසේ කළද එය සාර්ථක විය හැකි නොවේ. නමුත් මේ අන්දමින් හෝ එවැනි විධිමත් ප්‍රතිපත්ති මාලාවක් සැකසීමෙහිලා තැත් දැරීම සතුටුදායක තත්ත්වයකි. මෙය ක්‍රමිකව ක්‍රියාවට නැංවිය යුත්තක් වේ.

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යංශය මගින් ප්‍රකාශයට පත් කොට ඇති ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියෙහි ''තොරතුරු අයිතිය'' පිළිබඳව කිසිදු සඳහනක් නැති නමුත් තමාට ළඟා විය හැකි තොරතුරු හෝ ප්‍රායෝගිකව සහය කරගනිමින් යම් ගවේෂණාත්මක ක්‍රියාවලියක නිරත වීමට මාධ්‍යවේදීන් උත්සහ දරන්නේ අල්ප වශයෙනි. මේ තත්ත්වය තුළ පවත්නා තත්ත්වයට වඩා වැඩි තොරතුරු නිදහසක් ලබා ගැනීමට යත්න දරන්නේ කුමන අරමුණින්ද යන්න ගැටළු සහගතය. එසේම මෙවන් තත්ත්වයක් තුළ තොරතුරු අයිතියේ වර්ධනයක් අපේක්ෂා කිරීම ඵල රහිතය.

සන්නිවේදන න්‍යායන් හා භාවිතය අතර යම් ආකාරයක පරස්පරතාවක් පවත්නා බව සැබෑය. සන්නිවේදන ආචාර්යවරුන් හා ආයතන අතර මනා සබඳතාවක් ගොඩනගා ගැනීම තුළ මෙකී තත්ත්වයෙහි යම් සාධනීය වෙනසක් නිර්මාණය කරලීම අපහසු නොවේ. පසුගිය වකවානුව තුළ පැවති යුද කාලීන මාධ්‍ය භාවිතාව තුළ වෘත්තීය සාරධර්ම පිළිබඳ අවධානය යොමු වූයේ අල්පාකාරයෙනි. නමුත් යුද්ධය නිමා වී ගෙවෙන මෙම පශ්චාත් යුද අවධිය තුළද එම තත්ත්වයෙහි වෙනසක් සිදු වී නැත. දමිළ මාධ්‍ය තුළ මෙකී තත්ත්වය වඩාත් ඉස්මතුව පෙනේ. කෙසේ වතුදු සිදු විය යුත්තේ මාධ්‍ය කර්මාන්තය හා බුද්ධිමය පාර්ශ්ව අතර මනා සබඳතාවක් හා අන්‍යෝන්‍ය අධ්‍යයන කාර්යයක් ගොඩනැංවීමයි.

මෙවන් තත්ත්වයක් තුළ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වෙත ද පැවරෙන වගකීම් වේ. බුද්ධිමය පාර්ශවයක් වශයෙන් ක්ෂේත්‍රයට වැදගත් වන නව පර්යේෂණ සිදු කිරීම අවශ්‍යය. නමුත් බොහෝ විට මෙවැනි වගකීම් පැහැර හැරී යන ආකාරයක් දක්නට හැක. මෙරට තුළ මාධ්‍ය විකාශය වීමේ හෝ සමානතාවක් දක්නට නැත. ඇතැම් නාලිකා රටේ දුරබැහැර ප්‍රදේශයන් හි මනා විකාශන තත්ත්වයකින් යුතු නොවේ. මෙවන් සංවර්ධනය වෙමින් පවත්නා තත්ත්වයක් තුළ මාධ්‍ය සඳහා යම් ආකාරයක නියාමනයක් ක්‍රියාත්මක වීම අවශ්‍යයෙන් ම සිදු විය යුතුයි. අප සතුව දියුණු මාධ්‍ය සංස්කෘතියක් නොපවතී. මාධ්‍යවේදීන් බඳවා ගන්නා නිසි ක්‍රමවේදයක් නොපවතී. එදා පටන් අද දක්වාම මෙවැනි ක්‍රියාවලීන් විවිධ සමාජ දේශපාලන ක්‍රියාකාරකම් මත පසුබිම් වන අයුරු දැකගත හැකිවේ.

නව මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් වීමේ දී එයට අන්තර්ගත විය යුතු නව අදහස් කිහිපයකි. පවත්නා මාධ්‍ය ප්‍රතිපත්තිය තුළ නව මාධ්‍ය පිළිබඳ කිසිදු සඳහනක් නැත. එයට අදාල ව ප්‍රතිපත්ති සකස් විය යුතුය. යම් නියාමනයක් ඇති විය යුතුය. එසේම ලංකාවේ පර්යේෂණ සිදු කෙරෙන නමුත් සන්නිවේදන අධ්‍යාපනයෙහිලා භාවිත කරනු ලබන්නේ විදේශීය කෘතීන්ය. ආසියානු හෝ ශ්‍රී ලාංකික පර්යේෂණ වාර්තා ඇසුරින් අධ්‍යයනය කිරීම ඉතා අල්ප වශයෙන් සිදු වේ. මෙම තත්ත්වය වෙනසකට බඳුන් වීම අවශ්‍යය. මෙරටේ සිදු කෙරෙන පර්යේෂණ සඳහා අප විසින්ම සුදුසු තත්ත්වයේ පිළිගැනීමක් ලබා දිය යුතුය. එය දේශීය භාෂාවට පමණක් ම සීමා විය යුතු නොවේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පාදිත සෙසු ආසියානු රටවල පර්යේෂණ පත්‍රිකා හා වාර්තා ද මෙහිලා උපයෝගී කර ගත හැක. මෙම ක්‍රියාවලිය ජාතික ප්‍රතිපත්තිමය තලයක සිට ඇරඹී ක්‍රියාත්මක වීම අවශ්‍යය. කෙසේ නමුදු මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය විය යුත්තේ සමාජ සංවාදයක් ඔස්සේ ය යන්න අවධාරණය විය.

මාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික භාවිතාව පිළිබඳ රටේ බුද්ධිමය පාර්ශ්වය සතුව මනා දැනුවත්භාවයක් වුවද ඉන් ඔබ්බට සාමාන්‍ය ජනතාව අතර එවැනි ගැඹුරු අවබෝධයක් නොපවතී. ඔවුන්ද මේ කරුණු පිළිබඳව මනා ව දැනුවත් වන තෙක් මෙකී ක්‍රියාවලිය සපුරා සාර්ථක වීමක් අපේක්ෂා කළ නොහැකිය. මේ සමුළුව ඔස්සේ ආචාර්යවරුන්ගේ සංවිධානයක් බිහි කොට බලපෑම් කණ්ඩායමක් වශයෙන් අවශ්‍ය බලපෑම නිර්මාණය කිරීම අවශ්‍යය. මාධ්‍යවේදීන් හා සිවිල් සමාජය ද මෙහිලා දායක කර ගැන්ම වඩාත් වැදගත් වේ.

නව මාධ්‍ය වැනි නව ප්‍රවණතා නියාමනයේ දී හුදු නීති රෙගුලාසිවලට සීමා නොවී වඩාත් නිර්මාණශීලී ක්‍රමවේදයක් වෙත යොමු වීම අතිශය වැදගත්ය. අනෙක් පසින් නව මාධ්‍ය ඔස්සේ ග්‍රාහකයා වෙත මුක්ත කරනු ලබන අහිතකර බලපෑමෙන් මිදිය හැක්කේ කෙසේද? යන කරුණ පිළිබඳ ග්‍රාහකයා දැනුවත්භාවයට පත් කිරීම ද වඩාත් කාලෝචිතය.

මෙම වකවානුව තුළ මාධ්‍ය හා මාධ්‍යකරුවන් විසින් වාර්තාකරණය සිදු කළ යුත්තේ පශ්චාත් යුද සමාජයකට යෝග්‍ය වන පරිදිය. එසේම රටේ බුද්ධිමත් පාර්ශ්වය වශයෙන් අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍යත්වයට බලපෑම් කිරීමට හැකියාව පවතී. එසේම ජනමාධ්‍යයේ වගකීම පරම සත්‍යය ප්‍රකාශ කිරීම නොවේ. ජනමාධ්‍ය ඔස්සේ පොදු මතවාදයක් ගොඩ නැංවිය හැක. එය කිසිවිටෙකත් පරම සත්‍යය විය යුතු යැයි අපේක්ෂා කළ යුතු නොවේ. මෙය ප්‍රායෝගිකත්වය හා සන්නිවේදන න්‍යාය අතර පවත්නා ගැටුමයි. ජනමාධ්‍යවේදය තුළ පරමාදර්ශී බවක් හඳුනාගත නොහැකිය.

# ජාතික ජනමාධ්‍ය සමුළුව - 2010

## පස්වන සැසිය

## පස්වන සැසිය

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංවිධානයක් බිහි කිරීම මූලික තේමාව කරගත් මෙම සැසියෙහි මූලාසනය දරණ ලද්දේ මහාචාර්ය මාපා තිලකරත්න විසිනි.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංවිධානය සඳහා නිලධාරී මණ්ඩලයක් පත් කිරීම සහ 2011 වසරේ පැවැත්වීමට නියමිත ජාතික ජනමාධ්‍ය සමුළුවට අදාල කරුණු සාකච්ඡාවට බඳුන් විය.

මේ අනුව ඉදිරි වර්ෂය සඳහා සභාපතිවරයා වශයෙන් මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස තේරී පත් විය. නිලධාරී මණ්ඩලය පත් කිරීමේ දී 2011 වසරෙහි ජනමාධ්‍ය සමුළුව පැවැත්වීමට නියමිත සත්කාරක විශ්වවිද්‍යාලයෙහි ආචාර්යවරයෙකු උපසභාපතිවරයා වශයෙන් පත් කිරීම වඩාත් යෝග්‍ය බවත්, ඉන්පසු එළැඹෙන වසරේදී එම උපසභාපතිවරයා සභාපති වශයෙන් පත් වීම සුදුසු බවත් යෝජනා විය.

2011 වසරේ ජාතික ජනමාධ්‍ය සමුළුව හොරණ ශ්‍රී පාලි මණ්ඩපයෙහි පැවැත්වීමට යෝජනා වූ අතර ඒ අනුව උපසභාපතිවරයා වශයෙන් එම විශ්වවිද්‍යාලයේ ආචාර්ය රංජන් හෙට්ටිආරච්චි මහතා තේරී පත් වූයේ කථිකාචාර්ය ප්‍රදීප් වීරසිංහ සහ නාලක විජේවර්ධනගේ යෝජනා ස්ථිරත්වයෙනි.

මෙම සංගමයේ ලේකම් වශයෙන් මහාචාර්ය මාපා තිලකරත්න තේරී පත් වූ අතර භාණ්ඩාගාරික තනතුර සඳහා විජයානන්ද රූපසිංහ තේරී පත් විය.

සඟරා සංස්කාරක මණ්ඩලය සඳහා සාමාජිකයන් පස් දෙනෙකු තෝරා ගන්නා ලදී. එනම්, යාපන විශ්වවිද්‍යාලයෙහි ක්‍රිතිකා තරුමරාජා, නැගෙනහිර විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය එස්. රඝුරාම්, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි සේනානි හරිශ්චන්ද්‍ර, රජරට විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය සේන නානායක්කාර සහ හොරණ ශ්‍රී පාලි මණ්ඩපයෙහි ධර්ම කීර්ති ශ්‍රී රංජන් වශයෙනි.

මීට අමතරව කාරක සභාව සඳහා සෑම විශ්වවිද්‍යාලයකින්ම එක් ආචාර්යවරයෙකු බැගින් කාරක සභිකයන් දස දෙනෙකු තේරී පත් විය. එනම්, කොළඹ විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය අජන්තා හපුආරච්චි, ශ්‍රී පාලි මණ්ඩපයෙහි නාලක විජේවර්ධන, විවෘත විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය මහීම් මෙන්ඩිස්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි මහාචාර්ය ධම්මික ගංගානාත්, සබරගමුව විශ්වවිද්‍යාලයෙහි සුනිල් සෙනෙවි, රජරට විශ්වවිද්‍යාලයෙහි තිස්ස වීරසේකර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි අතුල සමරකෝන්, නැගෙනහිර විශ්වවිද්‍යාලයෙහි පූජ්‍ය සී.පී. රාජේන්ද්‍ර, යාපන විශ්වවිද්‍යාලයට අනුබද්ධ මාධ්‍ය සම්පත් හා පුහුණු මධ්‍යස්ථානයෙහි කුමාරලිංගම් පදියදරන් හා කැලණිය විශ්වවිද්‍යාලයෙහි මනෝජ් ජිනදාස ආදී වශයෙනි.

මේ සඳහා ගිණුම් පරීක්ෂකවරයෙකු පත් කිරීම අනවශ්‍ය බවත් අවශ්‍ය අවස්ථාවන්හි දී අදාල විශ්වවිද්‍යාලයෙහි ගණකාධිකරණ පීඨය හා එක්ව ගිණුම් කටයුතු කිරීම අනුමත විය.

එසේම සංගමයේ උපලේකම්වරයා වශයෙන් ශ්‍රී පාලි මණ්ඩපයෙහි සුගත් මහින්ද සෙනරත් තේරී පත් වූයේ ප්‍රදීප් වීරසිංහ හා ධර්ම කීර්ති ශ්‍රී රංජන් යන අයගේ යෝජනා ස්ථිරත්වයෙනි.

නිලධාරී මණ්ඩලය පත් කිරීමෙන් අනතුරුව සංගමයේ මූලික කාර්යයන් හි ව්‍යුහය කෙසේ විය යුතුද? යන්න පිළිබඳ අවධානය යොමු විය.

සංගමය සඳහා ව්‍යවස්ථාවක් සකස් කළ යුතු බවට යෝජනා වූ අතර එය 2010 ජාතික ජනමාධ්‍ය සමුළුව පැවති කැලණිය විශ්වවිද්‍යාලයෙහි ම සම්පාදනය කරන බවට තීරණය විය. මේ සඳහා සම්බන්ධීකාරක වශයෙන් විජයානන්ද රූපසිංහ මහතා යෝජනා විය.

ශ්‍රී ලාංකික පර්යේෂණ දිරිගැන්වීම සඳහා වාර්ෂික පර්යේෂණ සැසිවාරයක් (Annual Research Symposium) පැවැත්වීම සහ සත්කාරක විශ්වවිද්‍යාලය මගින් වාර්ෂික ප්‍රකාශනයක් සකස් කිරීම වැදගත් බව තීරණය විය.

ජනමාධ්‍ය හා ජනසන්නිවේදන විෂය හදාරන විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සඳහා ජනමාධ්‍ය කර්මාන්තයෙහි පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල හා ජනමාධ්‍ය ආයතන එක්ව මෙවන් සමුළු සංවිධානය කළ යුතු බව තවත් යෝජනාවක් විය.

ජනමාධ්‍ය සමුළුවට අදාලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම ඔස්සේ මනා අන්තර් සබඳතාවක් පවත්වාගෙන යා හැකි බවට යෝජනා විය.

අන්තර් විශ්වවිද්‍යාල මට්ටමින් ආචාර්යවරුන් හුවමාරු වැඩසටහනකට යොමු වීමෙන් අධ්‍යයන කාර්යයන් වඩාත් ගුණාත්මක තත්ත්වයකට පත් කරවා ගත හැකි බවට යෝජනා විය.

සංගමයේ ක්‍රියාකාරකම් සඳහා අරමුදල් එක් රැස් කිරීම පිළිබඳව යෝජනා විය. සාමාජික මුදල් අය කිරීම සාර්ථක නොවන හෙයින් වෙනත් ක්‍රම මගින් සංගමය මගින්ම අරමුදල් තර කළ යුතු බවට තීරණය විය. ජනමාධ්‍ය අමාත්‍යංශය හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය මඟින් කිසියම් මූල්‍ය අනුග්‍රහයක් ලබා ගැනීමට උත්සහ දැරිය යුතු යැයිද යෝජනා වුවත් සංගමයට අදාලව ව්‍යවස්ථාවක් සකසා පසුව සංගමය මගින්ම අරමුදල් සම්පාදනය වැදගත් බවට තීරණය විය.

2010 ජනමාධ්‍ය සමුළුවේ සමුළු ප්‍රකාශනය සඳහා මූලික කෙටුම්පත, සාකච්ඡාවට බඳුන් කිරීම සඳහා සභාව වෙත ඉදිරිපත් කෙරිණි. එයට අදාලව යම් යම් සංශෝධන ඉදිරිපත් විය. ඒ අනුව, කැලණිය සමුළු

ප්‍රකාශනයෙහි වගන්ති සටහන් කිරීමේ දී ජනමාධ්‍ය කර්මාන්තය, රජය, ජාත්‍යන්තර ප්‍රජාව, විශ්වවිද්‍යාල ආදී ක්ෂේත්‍රයන් විෂයෙහි කෙරෙන ඉල්ලීම් වශයෙන් වෙන වෙනම වගන්ති ඉදිරිපත් විය යුතු බවට යෝජනා විය.

එසේම ජාතිය ගොඩනැගීමේ කාර්යයේදී හා සංවර්ධන කාර්යයේ දී ජනමාධ්‍යයේ කාර්යභාරය කෙබඳුද යන්න පිළිබඳ අදහසක් මෙම ප්‍රකාශයට එක් විය යුතුය යන්න තවත් යෝජනාවකි.

ජනමාධ්‍ය හා සන්නිවේදන අධ්‍යයනයේ දී ගැටළුවක් බවට පත්ව ඇති සිංහල හා ද්‍රවිඩ භාෂාවෙන් සීමිත කෘති සංඛ්‍යාවක් පවත්නා හෙයින් එම භාෂාවෙන් කෘති සම්පාදනය කිරීම වැදගත් බව අදහස් විය. මෙයට විකල්ප වශයෙන් සඟරා පල කිරීමේ දී එයට දමිළ මාධ්‍යයෙන් වන එක් ලිපියක් හෝ අන්තර්ගත කිරීම සහ ඉදිරියේ දී පළ වන සඟරා ද්වී භාෂාමය හෝ ත්‍රෛභාෂාමය ස්වරූපයෙන් යුක්ත විය යුතු බව ද යෝජනා විය.

ඉදිරියේ දී පැවැත්වෙන සමුළු සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට අමතරව ජාතික අධ්‍යාපන ආයතන වැනි වෙනත් ආයතන සහභාගී කරවා ගැනීම සුදුසු යැයි යෝජනා විය. නමුත් මෙම සමුළුව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ප්‍රමුඛස්ථානය හිමි වන්නක් බවත් නිරීක්ෂකයන් වශයෙන් වෙනත් පාර්ශ්ව සම්බන්ධ කරගනු ලබන්නේ අදහස් ප්‍රකාශනය සඳහා පමණක් බවත් අවධාරණය විය.

2010 වසරේ දී පවත්වනු ලැබූ මෙම ප්‍රථම සමුළුව ඓතිහාසික හා තීරණාත්මක සංධිස්ථානයකි. දීර්ඝ කාලීන ප්‍රයත්නයක ජයග්‍රාහී ප්‍රතිඵලයක් වශයෙන් මෙම සමුළුව හැඳින්විය හැක. අන්තර් සහයෝගීතාවෙන් යුතුව ශාස්ත්‍රීය හා සෙසු නිර්මාණාත්මක කාර්යයන් ඉදිරියට පවත්වා ගෙන යාම වැදගත්ය. ඉදිරිපත් වූ යෝජනාවන්ට අනුව කැලණිය සමුළු ප්‍රකාශනය සංශෝධනය කොට රජය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ජනමාධ්‍යායතන, විශ්වවිද්‍යාල බලධාරීන් හා සියලු සාමාජිකයන් වෙත ලැබෙන්නට සලස්වනු ඇත.

ජාතික ජනමාධ්‍ය සමුළුව පිළිබඳ ජනතා දැනුවත්භාවයක් ඇති වී තිබෙන මෙවැනි අවස්ථාවක මෙම ක්‍රියාවලිය ඉදිරියට පවත්වාගෙන යාම අපහසු නොවෙයි. මෙම එකමුතුව තුළ පවත්නා විසම්මුතික බව හා විවිධ මතවාද හා විවිධ හැඩතල සහිත බව අඛණ්ඩව ආරක්ෂා කරගත යුතු සාධනීය ලක්ෂණයකි. එසේම ඒ ඒ විශ්වවිද්‍යාල තුළ අධ්‍යයන පටිපාටියේ හා විෂයමාලාවන් හි ඇති සුවිශේෂී අනන්‍යතාවන් ද එසේම ආරක්ෂා කළ යුතුය. ජනමාධ්‍ය හා සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධියෙහි ලා වැදගත් ඒකරාශීත්වයක් වන මෙහි ඵල නෙළා ගැනීමෙහි ලා තවත් කාලයක් ගත වනු ඇත.